සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජනවාරි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2024-02-10
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ආරියදාස,** ප්‍රමුඛ පෙළේ ඇඟළුම් ආනයන ආයතනයක් වන **රත්සෙල එන්ටර්ප්‍රයිස්** හි තනි අයිතිකරු වේ. ඔහුගේ වෙළෙඳ ව්‍යාපාරය වර්ෂ 42 ක් පුරාවට ඔහු විසින් සාර්ථකව සදුකරනු ලබයි. ඔහුගේ පුතා සහ දියණියන් ව්‍යාපාරයට නෛතිකව සම්බන්ධ කරගැනීමට කාලය මෙය බව ඔහුට හැඟෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **ආරියදාස** ට තම අරමුණ සාක්ෂාත් කර ගැනීමට **රත්සේල එන්ටර්ප්‍රයිස්** පරිවර්තනය කිරීම සඳහා සළකා බැලිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ඉහත (a) හි හඳුනාගන්නා ලද ව්‍යාපාර සංවිධාන වර්ගවලට අදාලව පහත සඳහන් නෛතික පැතිකඩයන් **හඳුනා දක්වන්න**:

(i) බදුකරණය.

(ii) වගකීම. (ලකුණු 03)

**(මුළු ලකුණු 05)**

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත D ෆැශන්ස් (පෞද්ගලික) සමාගම,** ("සමාගම") කළමනාකරණ කණ්ඩායමක් පත් කරමින් ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම හා ආයතනයේ අවදානම් මගහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ස්ථාපිත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුවක් (Risk Management Framework) ස්ථාපිත කරන ලදී. සමාගමේ මෙහෙයුම් බාධාවකින් තොරව දිගටම පවත්වාගෙන යාම තහවුරු කිරීම මෙහි අරමුණ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුවක් භාවිතයෙන් ලැබෙන අවස්ථාවන් (opportunities) / වාසි (benefits) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

මූල්‍ය තොරතුරු පරිශීලකයින්ට එකී තොරතුරු සාධාරණව නිරවද්‍ය බවටත් උචිත ආකාරයට පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවටත් තහවුරුවක් ලබාදීම සඳහා සහතිකවීමේ කාර්යභාරයන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සාධාරණ සහතිකවීමේ කාර්යභාරයන් (Reasonable Assurance Engagement) හා සීමිත සහතිකවීමේ කාර්යභාරයන් (Limited Assurance Engagement) ලෙස සහතිකවීමේ කාර්යභාරයන් වර්ග දෙකක් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සහතිකවීමේ කාර්යභාරයක පාර්ශවයන් තුන(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) "සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක" සහ "සීමිත සහතිකවීමේ කාර්යභාරයක" අතර වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

තත්ත්වපාලන පද්ධතියක් යනු විගණන සමාගමක කාර්යභාරයන්හි අඛණ්ඩ ගුණාත්මකභාවය තහවුරු කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමූහයක. තත්ත්වපාලන පද්ධතියක මූලිකාංග හයක් වේ. ආදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් එවැනි එක් මූලිකාංගයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් යටතේ ඇති විගණන සමාගමක් විසින් පවත්වාගත යුතු ස්වාධීනත්වය යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) තනි විගණන කාර්යභාරයක් "සමාලෝචනය" කිරීමේදී සලකා බැලිය යුතු කරුණු දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත නිම් හෝල්ඩිංස් (පෞද්ගලික) සමාගම** (NHL) ඉදිකිරීම් සහ සිවිල් ඉංජිනේරු සේවා සැපයීමෙහි නිරතව සිටී. පසුගිය වර්ෂ හයක් (6) පුරාවරට NHL හි බාහිර විගණනය ඔබගේ විගනණ සමාගම විසින් සිදුකර ඇත. දැනට රට තුළ පවතින වාතාවරණය මත NHL හි අයභාරය පසුගිය වර්ෂ තුනක් (3) පුරාවට දිගින් දිගටම අඩුවී ඇත. ඉදිකිරීම් කර්මාන්තය තුළ පවතින සීමිත අවස්ථාවන් හේතුවෙන් 2022 වර්ෂයේදී කළමනාකරණ අධ්‍යක්ෂකවරයා විසින් මැණික් කපන යන්ත්‍රයක් ආනයනය කර මැණික් ව්‍යාපාරයක ආයෝජනයක් සිදුකර තිබේ. NHL හි ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මැණික්වලට අදාල කාර්මික පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. NHL විසින් දේශීය පතල්කරුවන්ගෙන් මැණික් මිලදී ගනු ලබන අතර, කැපීම් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2022/23 මූල්‍ය වර්ෂයේ අවසාන මාස කිහිපය තුළ ඒවා සාර්ථකව අපනයනය කර ඇත.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ලබාදී ඇති අතර, එහි පෙන්නුම් කරන අයභාරයෙන් 90% ක් මැණික් අපනයනය මගින් උපයා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සමස්ත විගණන උපායමාර්ගය පිහිටුවීමේදී, විගණක විසින් සළකා බැලිය හැකි කරුණු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) NHL හි විගණක විසින් මූල්‍ය ප්‍රකාශනවල විගණනය ඉටුකිරීමේදී අවබෝධ කරගත යුතු ක්ෂේත්‍ර / පැතිකඩ හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

RF හොටෙල්ස් හි විගණකයන් ලෙස ඔබගේ විගණන සමාගම පත්කර ඇත. විගනණය සිදුකරන අතරතුර, ණයගැති හිඟ ශේෂ ලැයිස්තුව තුළ පහත සඳහන් ශේෂයන් ඇතුලත්ව ඇති බවට නිරීක්ෂණය විය:

| ණයගැතියාගේ නම | එකතුව (රු.) | දින 0-30 | දින 30-90 | දින 90-120 | දින 120 ට වැඩි |
|---|---|---|---|---|---|
| AB ටුවරිස්ට්ස් | 1,850,300 | 500,000 | | | 1,350,000 |
| ලංකා විසිටර්ස් | (650,000) | (650,000) | | | |
| ගල්ෆ් ටුවර්ස් | 230,000 | 80,000 | 50,000 | 50,000 | 50,000 |

ඉහත ලැයිස්තුවෙහි සඳහන් තොරතුරු සළකා බලන විට, එහි සඳහන් ණයගැති ශේෂ, ණයගැතියන්ගෙන් ලද තහවුරුකිරීම් සමඟ එකඟ නොවන බවට නිරීක්ෂණය විය. **ලංකා විසිටර්ස්** ට අදාලව විකුණුම් ඉන්වොයිස වාර්තා කර නොතිබුණි. AB **ටුවරිස්ට්ස්** විසින් ඔවුන්ගේ දීර්ඝ කාලීනව පවතින ලැබිය යුතු මුදල වන රු.1,350,000/- ගෙවා තිබුණද, ඊට අදාල මුදල් ප්‍රමාණය සමාගමේ බැංකු ගිණුමට බැරවී නොමැත. ඔබ විසින් මේ පිළිබඳව කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට දැනුම් දුන් විට සියලුම ගනුදෙනු විස්තරාත්මකව සළකා බලා වංචාවක් සිදුවී ඇත්දැයි විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස ඔහු ඔබගෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වංචාවක් (fraud) යන්න **නිර්වචනය කරන්න.** (ලකුණු 03)

(b) කළමනාකරණ අධ්‍යක්ෂකවරයා විසින් මූල්‍ය ප්‍රකාශනවල වංචා සම්බන්ධයෙන් සිදුකර ඇති ඉල්ලීම පිළිබඳව විගණකගේ වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) වංචනික මූල්‍ය වාර්තාකරණයෙහ අවදානම වැඩිකළ හැකි තත්ත්වයන් හෝ සිදුවීම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

**(මුළු ලකුණු 10)**

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත ශිරාන් ගාමන්ට් (පෞද්ගලික) සමාගම** (SGL), අඩු පොලිය යටතේ රු. මිලියන 100 ක ණය මුදලක් රාජ්‍ය බැංකුවකින් ලබා ගැනීමට සළකා බලමින් සිටී. එම ණය මුදල ලබාගැනීම සඳහා එළඹෙන වසර 5 ක කාලය සඳහා පුරෝකතනය කළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයක් සිදුකර දෙන ලෙස SGL හි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා, ඔබ ආයතනයෙන් ඉල්ලීමක් සිදුකර ඇත. ඇඟළුම් සම්බන්ධයෙන් පවතින ආනයන සීමා හේතුකොටගෙන SGL මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති අතර, මෙම ණය මුදල අවශ්‍ය වන්නේ SGL හි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම සඳහා ය.

SGL හි බාහිර විගණනය වෙනත් විගණන සමාගමක් විසින් සිදුකරනු ලබන අතර, බැංකු ණය ලබාගැනීම සඳහා වන පුරෝකතනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඊළඟ වර්ෂය සඳහා වන SGL හ බාහිර විගණනය ඔබ ආයතනය වෙත ලබාදීමට SGL හි කළමනාකරණ අධ්‍යක්ෂකවරයා තීරණය කර ඇත. SGL හි විගණනය පිළිගත්තේ නම් ඔබ ආයතනයේ ආදායමෙන් 25% ක් SGL මඟින් ලැබෙනු ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) SGL හි බාහිර විගණන කාර්යභාරය බාරගැනීමේදී ඔබ විසින් සළකා බැලිය යුතු ප්‍රධාන පැතිකඩයන් (key aspects) හා අවශ්‍යතාවයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) ඉහත කරුණුවලට අනුව ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීමේ තර්ජන (threats) දෙකක්(02) **තක්සේරු කරන්න.** (ලකුණු 04)

(c) ඉහත තර්ජන ඉවත් කිරීම සඳහා / පිළිගතහැකි මට්ටමකට අඩුකිරීම සඳහා ඔබ ආයතනයට ස්ථාපිත කළ හැකි ආරක්ෂිත ක්‍රම තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත Plumbing World සමාගම** (PWL), ජලනල උපකරණ තොග හා සිල්ලර වෙළඳාමෙහි නිරතව සිටී. තොග නිලධාරියාගේ ඉල්ලීම මත ගැනුම් විධායක විසින් ඇණවුම් සිදුකරනු ලබන අතර, ගැනුම් කළමනාකරු විසින් ඇණවුම් අනුමත කරයි. ඉන් අනතුරුව ලේඛණ, වාර්තාකිරීම සඳහා සහය ගණකාධිකාරිවරයා වෙත යවනු ලබයි. ගැනුම් සිදුකරනු ලබනුයේ සමාගම සමඟ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගෙන. කෙසේවෙතත්, ලියාපදිංචි කිරීම සඳහා සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා සුදුසු පාලනයන් සමාගම තුළ නොතිබුණි. සමාගම තුළ අඩු වටිනාකමක් ඇති තොග විශාල ප්‍රමාණයක් සහ අධික වටිනාකමක් ඇති තොග අයිතම කුඩා පමාණයක් ඇත. මේ නිසා ගබඩාව වෙත පිවිසීම ජෛවමිතිකයන් (bio metrics) මගින් ආරක්ෂාකර ඇත. කළමනාකාරීත්වය විසින් දෛනිකව තොග මට්ටම් වාර්තා සමාලෝචනය කරනු ලබයි. තොග නිලධාරියා විසින් මාසිකව භෞතික තොග ගණනය කිරීම් සිදුකරනු ලබන අතර, එම භෞතික තොග මත පදනම්ව පද්ධතිය තුළ ඇති තොගවලට ගැලපීම් සිදුකරනු ලබයි.

සමහරක් පාලනයන් පිටුපස ඇති අවදානම හඳුනා නොගැනීම නිසා එම පාලනයන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විසින් ස්ථාපනය කර නොමැති බවට අභ්‍යන්තර විගණක විසින් වාර්තාකර ඇත. තොගවල ගුණාත්මකභාවය, තොග නිලධාරියා විසින් පරීක්ෂා කරනු ලබන නමුත්, ඔහුට සමහරක් අයිතමවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් තරමේ දැනුමක් නොමැත. ඔහුගේ දැනුම ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් සමාගම, අඩු ගුණාත්මකභාවයකින් යුක්ත භාණ්ඩ සම්බන්ධව අලාභ දරා ඇත. සමාගම වර්තමානයේ ගුණාත්මක බව පරීක්ෂා කිරීමට විශේෂඥයෙකු සේවයෙහි යෙදවීමට සළකා බලමින් සිටින නමුත් එවැනි විශේෂඥයෙකු අපේක්ෂා කරන වැටුප් ඉතා ඉහළ මට්ටමක පවතී.

විකුණුම් පද්ධතිය තුලින් දෛනික විකුණුම් වාර්තා ජනනය කළ නොහැකි වේ. තවද, විකුණුම් ඉන්වොයිසිවල සඳහන් මිල ගණන් ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන මිල කියුම්වල (quotations) සඳහන් මිල ගණන්වලට වඩා වෙනස් බවට ගනුදෙනුකරුවන් පැමිණිලි කර ඇත. විකුණුම් පද්ධතිය තුළ යාවත්කාලීන කර ඇති මිල ලැයිස්තුවෙහි වැරදි පවතින බවත් එමනිසා අනුමත කරන ලද මිල ලැයිස්තුව සමඟ වෙනස්කම් පවතින බවත් විකුණුම් අධ්‍යක්ෂක විසින් නිරීක්ෂණය කර ඇත. තවද, සමහරක් ණයගැති ශේෂයන්, ණයගැති ලැයිස්තුව තුළ පෙන්නුම් නොකරයි. මෙයට හේතුව වී ඇත්තේ මෑත කාලීනව ඇණවුම් ලැබී නොමැති ගනුදෙනුකරුවන්, විකුණුම් සේවකයින් විසින් ප්‍රධාන ලැයිස්තුවෙන් මකා ඉවත් කිරීමයි. තවද, වයිරස් ප්‍රහාරයක් හේතුකොටගෙන විකුණුම් පද්ධතිය දිනක් ක්‍රියාවිරහිතව පැවතුණි. මේ නිසා සමහරක් දත්ත නැතිවී ඇති අතර, ඒවා නැවත ලබාගැනීම සඳහා උපස්ථ කිරීමේ (backups) පහසුකම් සමාගම සතුව නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) (i) PWL හි අභ්‍යන්තර පාලන දුර්වලතා පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(ii) ඉහත (a)(i) හි හඳුනාගන්නා ලද එක් එක් දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා එක් යෝජනාවක් බැගින් **සඳහන් කරන්න.** (ලකුණු 05)

(b) (i) PWL හි ගැනුම් සහ තොගවලට අදාලව ස්ථාපනය කළ හැකි පාලන ක්‍රියාකාරකම් හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(ii) අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණක් වශයෙන් "මෙහෙයුම්වල සඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය" **යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) අභ්‍යන්තර පාලන පද්ධතියක ආවේණික සීමා (inherent limitations) හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) PWL හි විකුණුම් පද්ධතියට අදාලව ස්ථාපනය කළ හැකි යෙදවුම් පාලනයන් දෙකක්(02) සහ පොදු පාලනයන් දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

(A) **පෙරේරා, පෙරේරා සහ සමාගම** යන විගණන ආයතනයේ එකම පරිචයේ යෙදෙන්නා වේ. ආයතනය විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමෙහි නිරතව සිටී. පහත සඳහන් අවශ්‍යතාවයන් එයට සුදුසු බවට පුහුණු කළමනාකරු විසින් හඳුනාගෙන ඇත:

- අස්තිත්වයේ මූල්‍ය තොරතුරු, අනෙකුත් අදාල මූල්‍ය තොරතුරු සමඟ සැසඳීම.
- මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු අතර සබඳතා උපනති විශ්ලේෂණ භාවිතයෙන් හඳුනා ගැනීම.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත A සමාගමෙහි** විගණනය සිදුකරන අතරතුර, සම්බන්ධිත පාර්ශව සමඟ වූ ගනුදෙනු සම්බන්ධයෙන් වන හෙළිදරව් කිරීම් පරීක්ෂා කිරීමට **පෙරේරා** විසින් විගණන කණ්ඩායමේ කණිෂ්ඨ සාමාජිකයෙකු පත්කර ඇත. විගණන ලේඛණගතකිරීම් තුළ පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් පමණක් වන බැවින් අවදානම් තක්සේරු කිරීමක් සිදුකර නොමැත. ප්‍රවර්තන වර්ෂයේ ශේෂයන් ලෙජරයෙන් ලබාගැනීම මඟින් පසුගිය වර්ෂයට අදාල සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධයෙන් වන හෙළිදරව් කිරීම් යාවත්කාලීන කර තිබේ. ප්‍රවර්තන වර්ෂය තුළදී පහත සඳහන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදුවී ඇත:
    - **සීමාසහිත D සමාගමෙන්** ලබාගත් දිගු කාලීන ණය - රු.2,000,000/-.
    - සම්බන්ධිත සමාගමක් වන **සීමාසහිත D සමාගමට** ලබා දුන් කෙටිකාලීන අත්තිකාරම් - රු.1,250,000/-.
    - **සීමාසහිත D සමාගමේ** ආයෝජන - රු. මිලියන 50.
    - **සීමාසහිත D සමාගමෙන්** ලද ලාභාංශ - රු.500,000/-.
- විගණන ක්‍රියාපටිපාටි ලෙස ණය සහ ආයෝජන සහතිකවලට අදාලව ශේෂ තහවුරු කිරීම් ඉල්ලා ඇති අතර, ලාභාංශ ලැබීම් පරීක්ෂාකර තිබේ. ඉහත ශේෂ, මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති අතර, එම ශේෂවලට අදාලව කළමනාකරණ නියෝජනයන් ලබාගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පුහුණු කළමනාකරු විසින් හඳුනාගෙන ඇති අවශ්‍යතා තුළ ඇතුළත් කළ හැකි විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනුවලට අදාලව සිදුකර ඇති විගණන ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය **තක්සේරු කරන්න.** (ලකුණු 05)

(c) සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු හඳුනාගැනීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(d) මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් සමාලෝචනය කිරීමේදී සිදුකළ හැකි විගණන ක්‍රියාපටිපාටි හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(B) විගණන සේවාදායකයන් තුන්දෙනෙකුට අදාල පහත සඳහන් කරුණු විගණන වාර්තාවල පූර්ව අනුමැතිය (pre-approval) සඳහා විගණනය භාර හවල්කරුවෙන යොමුකර ඇත:

| විගණන සේවාදායකයා | ප්‍රමාණාත්මකභාවය (රු.) | සැලකිල්ලට බඳුන් වී ඇති ගැටලු |
|---|---|---|
| **සීමාසහිත A සමාගම** | මිලියන 1 | SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ වූ ගිවිසුම්වලින් වූ අයභාරය සමඟ සැලකිය යුතු ලෙස අනුගත නොවීම හා වැරදි සහගත අයභාරය හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් වැරදි ලෙස හෙළිදරව් කිරීම. අයභාරය තුළ නිවැරදි කාලපරිච්ඡේදයකට අදාලව හඳුනාගැනීමේ වැරදි පැවතීම. ගැටළු දෙකම ලාභය, තොග, විකුණුම් සහ වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා බලපෑමක් ඇතිකර ඇති අතර, එය මූල්‍ය ප්‍රකාශනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් නිරූපණය කරයි. බලපෑම, ප්‍රමාණාත්මකභාවයට වඩා සැලකිය යුතු ලෙස වැඩිය. |
| **සීමාසහිත B සමාගම** | 125,000 | සම්පූර්ණ ලෙස ප්‍රතිපාදනය කළ යුතුව තිබූ දීර්ඝකාලීනව හිඟව පැවති රු.150,000/- ක ණයගැති ශේෂයක් සඳහා ප්‍රතිපාදනයක් සිදුකර නොමැති වීම. |
| **සීමාසහිත C සමාගම** | මිලියන 5.75 | රු.7,768,000/- ක් වූ සම්පූර්ණ වෙළෙඳ ලැබිය යුතු මුදල් ප්‍රමාණය, මුළු වත්කම්වලින් 5% ක් නිරූපණය කරයි. ණයගැති හානිකරණයන් සඳහා කිසඳු ප්‍රතිපාදනයක් සිදුකර නොමැත. පද්ධතිය තුළ පවතින දෝෂයක් නිසා ණයගැතියන්ගේ වයස් සීමා වාර්තාව ජනනය කළ නොහැක. ණයගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදනයන් සිදු නොකිරීමේ යෝග්‍යතාවය විගණකට පරීක්ෂා කිරීමට නොහැකි වී ඇත. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් ගැටළු මගින් පිළිවෙලින් **සීමාසහිත A සමාගමෙහි, සීමාසහිත B සමාගමෙහි සහ සීමාසහිත C සමාගමෙහි** ස්වාධීන විගණකවරයාගේ වාර්තාවන්හි මතයට ඇතිකරනු ලබන බලපෑම **තක්සේරු කරන්න.**

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව |

| | | | |
|---|---|---|---|
| | | | පරීක්ෂා කරන්න. |